**වයඹ පළාත් සභාව - 2015**

**-----------------------------**

වයඹ පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුළත් විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා රාජ්‍ය අංශ විසින් ප්‍රගුණ කරනු ලබන ගිණුම් පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 පළාත් සභා අරමුදල

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 2.2.2 අනෙකුත් ගිණුම්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආදායම් ගිණුම්

පළාත් මූල්‍ය රීති අනුව ආදායම් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත බලය ලබාදී ඇති ගණන්දීමේ නිලධාරීන් විසින් තමාට අයත් ආදායම් ගිණුම් සකස් කර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ ආදායම් සංකේතයන්ට අදාල ගිණුම් 23 ක් 2016 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) විසර්ජන ගිණුම් ඇතුලු අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2016 මාර්තු 31 දිනට ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | ගිණුමේ නම | 2015 වර්ෂයට අදාල<br>මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i). | විසර්ජන ගිණුම් | 28 | 28 | - | - |
| (ii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 78 | 64 | 14 | 04 |
| (iii). | පළාත් සභා මන්ත්‍රීවරුන්ට ණය පහසුකම් අත්තිකාරම් ගිණුම | 01 | 01 | - | - |
| (iv). | වාණිජ අත්තිකාරම් ගිණුම් | 08 | 05 | 03 | 01 |
| (v). | අරමුදල් හා ප්‍රඥප්ති ගිණුම් | 14 | 12 | 02 | - |
| (vi). | ආදායම් ගිණුම් | 23 | 23 | - | - |
| | එකතුව | 152 | 133 | 19 | 05 |

**2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක: SS/AS/AA දරන 2013 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර 2013 වර්ෂයේ සිට වාර්ෂික ගිණුම් උපචිත පදනම යටතේ පිළියෙල කළයුතු වුවද, වයඹ පළාත් සභාව එම චක්‍රලේඛය අදාල කරගෙන නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ගිණුම් තැබීම සඳහා අනුගමනය කරන ලද පදනම පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් හෙළිදරව් කර නොතිබුණි. පළාත් සභාව ආරම්භයේ සිට මේ දක්වා විවිධ ප්‍රාග්ධන ප්‍රතිපාදන මගින් ස්ථාවර වත්කම් වෙනුවෙන් සැළකිය යුතු වියදමක් දරා තිබුණද ඒවා ගිණුම් ගතකර නොතිබුණ අතර, සමාලෝචිත වර්ෂයේදීද මූලධන වියදම ලෙස රු.2,710,564,365 ක වියදම් දරා තිබුණි.

(ඇ) අනුමත අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ණය ලෙස අවසන් ගිණුමේ සඳහන් රු.148,616,768 ක ශේෂය වන්නේ වාණිජ අත්තිකාරම් ගිණුම් වලින් ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් ශේෂ එකිනෙකට හිලව් කිරීමෙන් පසුව ලැබුන ශේෂය බව නිරීක්ෂණය විය. එම නිසා වත්කම් හා වගකීම්වල නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් නොකරන බවත් එය පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූල නොවන ක්‍රියාවක් බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

**2.2.4 ගණකාධිකරණ අඩුපාඩු**

වයඹ පළාත් සභාවට අයත් ප්‍රධාන ලේකම් කාර්යාලය, සභා ලේකම් කාර්යාලය, වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය, අමාත්‍යාංශ 03 ක සහ දෙපාර්තමේන්තු 13 ක එකතුව රු.92,530,521 ක් වූ බැරකම්ද ප්‍රධාන ලේකම් කාර්යාලය ඇතුළු දෙපාර්තමේන්තු 10 ක එකතුව රු.211,304,618 ක මුදලක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳී තිබීමද ගිණුම් වලින් හෙළිදරව් කර නොතිබුණි.

**2.2.5 නොසැසඳු පාලන ගිණුම්**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හා ජේෂකර්ම දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසානයට පොදු තැන්පත් ගිණුම් වලට අදාලව දෙපාර්තමේන්තු පොත් හා පළාත් භාණ්ඩාගාර සටහන් සැසඳීමේදී එකතුව රු.8,747,647 ක වෙනසක්ද, ජේෂකර්ම දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගෙවීම්වල රු.2,834,600 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

(ආ) සෞඛ්‍ය දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සභා ලේකම් සහ දෙපාර්තමේන්තු 03 ක සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කර ඇති අත්තිකාරම් 'බී' ගිණුම්වල කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය හා දෙපාර්තමේන්තු පාලන ගිණුම අතර එකතුව රු. 5,962,250 ක වෙනසක් පැවතුණි.

(ඇ) කෘෂිකර්ම, ධීවර සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, සුළු වාරිමාර්ග සහ ගොවිජන සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, සභා ලේකම් කාර්යාලය, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ දෙපාර්තමේන්තු 04 ක රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර එකතුව රු. 12,552,711 ක වෙනසක් පැවතුණි.

(ඇ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2012 වර්ෂයේ ස්ථාන මාරු වී ගිය නිලධාරින් දෙදෙනෙකුගේ අත්තිකාරම් ගිණුම අනුව රු.173,800 ක ශේෂය ණයගැති ලේඛනය අනුව රු.449,942 ක් ලෙස දක්වා තිබුණි.

**2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගිණුම්

(i). සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත අත්තිකාරම් යටතේ ප්‍රධාන අමාත්‍යාංශයේ විස්කම් නිවස පවත්වාගෙන යාම සඳහා දෙන ලද රු.7,038,211 ක ණය මුදල වසර ගණනාවක සිට අයවීම් රහිතව අඛණ්ඩව ඉදිරියට ගෙන එන බැවින් මෙම ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ii). පළාත් භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ හානි හා පාඩු ලෙස රු.13,609,655 ක මුදලක් ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ 2010/2011 වර්ෂයන්හිදී සිදුවූ මුල්‍ය වංචාව හේතුවෙන් අලාභයන් පියවීම සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් ගෙවා තිබුණද වසර ගණනාවක් ගතවී ඇතත් එම කටයුතු අවසන් කර ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii). 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 (i) වගන්තිය හා 1973 සමුපකාර සමිති රීති 43 (ii) අනුව සෑම ලියාපදිංචි කල සමිතියක්ම රෙජිස්ටාර්තුමා විසින් නියමකල විට එතුමා විසින් නියම කරන පරිදි සමිතියේ වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 10 ට වැඩි නොවන හා රු. 5 කට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් වර්ෂයක් පාසා ගෙවිය යුතු විය. නමුත් හලාවත සහකාර කොමසාරිස් කාර්යාලයට අයත් සමුපකාර සමිති 257 ක් අරමුදලට එක් වරක්වත් මුදල් ගෙවා නොතිබූ අතර, එම සමිතිවලින් අය විය යුතු ශේෂය රු.2,356,483 ක් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

(i). තැන්පතු ගිණුම අනුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට 1993 වර්ෂයේ සිට රු.426,124 ක මුදලක් ගෙවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේදීද එම මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ii). පවරාගත් ණය ශේෂ වශයෙන් වසර ගණනාවක සිට පැවත එන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.1,081,161 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදීද ගෙවා අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii). පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ දස්කම් දැක්වූ ක්‍රීඩක/ ක්‍රීඩිකාවන් දිරිගැන්වීම සඳහා 2012/2013 හා 2013/2014 උපහාර උළෙලවලදී උපහාර ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 134 දෙනෙකු සඳහා ගෙවිය යුතු රු. 510,250 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබී පසුව අදාල අමාත්‍යාංශය වෙත යවා තිබුණද, 2015 වර්ෂය තුලදීද එම මුදල් ගෙවා අවසන් කර නොතිබුණි.

(iv). පළාත් අමාත්‍යාංශ 02 ක සහ දෙපාර්තමේන්තු 02 ක ස්ථාන මාරු වී පැමිණි නිලධාරින්ගේ නිරවුල් කලයුතු ණය ශේෂවල එකතුව රු.78,472,568 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පොදු තැන්පත් ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ලේකම් කාර්යාලයේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක වර්ෂ 02 ඉක්මවූ එකතුව රු.3,690,075 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) අයවීමට ඇති සේවක ණය

----------------------------

පළාත් අමාත්‍යාංශ 03 ක, දෙපාර්තමේන්තු 11 ක, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක, ප්‍රධාන ලේකම් කාර්යාලයේ, සභා ලේකම් කාර්යාලයේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ස්ථාන මාරු වි ගිය, මිය ගිය, සේවය හැර ගිය, වැඩ තහනම් වූ, විශ්‍රාම ගිය සහ වෙනත් හේතු මත නිරවුල් නොකළ ණය ශේෂවල එකතුව රු.75,523,287 ක් විය.

**2.2.7 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

**-------------------------------------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් කුරුණෑගල ආයුර්වේද රෝහලේ හා පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් අලව්ව ප්‍රාදේශීය රෝහලේ විදුලි ජනක යන්ත්‍ර සඳහා ඉන්ධන භාවිතය පිළිබඳව විධිමත් ලේඛණ පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් වරින්වර මිලදීගෙන තිබුණු ඉන්ධන ලීටර් 270 ක් වැයකල ආකාරය තහවුරු නොවීය.

(ආ) හොරොම්බුව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ ඖෂධ තොග පොත් යාවත්කාලීන කර නොතිබීම හා තොග පොත් පැන්සලෙන් ලකුණු කිරීම නිරීක්ෂණය විය. 2015 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා නිෂ්පාදනය කරන ලද ත්‍රිපලා ක්වාත බෝතල් 760 ක් බෙහෙත් ශාලාව සඳහා නිකුත් කර තිබුණද, බෙහෙත් ශාලා තොග පොතෙහි එම ලැබීම් සටහන් කර නොතිබීම හේතුවෙන් නිෂ්පාදිත ඖෂධ සත්‍ය වශයෙන්ම රෝගීන් සඳහා නිකුත් කල බවට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) පේෂකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගිණුම් විෂයයන් 07 කට අදාල වටිනාකම රු.69,947,371 ක් වු වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් ලේඛණ, උප ලේඛණ හා ශේෂ සනාථ යනාදී ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂයන් සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ හා පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ දක්වා තිබුණු පිළිවෙලින් රු. 15,013,112 ක හා රු. 5,177,851 ක ආරම්භක ශේෂයන් පිළිබඳ උපලේඛණ/ ස්ථාවර වත්කම් ලේඛණ විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂයන් පරීක්ෂා කිරීමට නොහැකි විය.

**2.2.8 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) වයඹ පළාත් සභාවේ 1990 අංක 08 දරන මුදල් ප්‍රඥප්තියේ | |
| vi වන පරිච්ඡේදයේ 11 වගන්තිය | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දින පැවති රු. 243,392,455 ක හිඟ පිරිවැටුම් බදු මුදලින් ප්‍රවර්තන වර්ෂය අවසාන වන විට අයකර ගෙන තිබුණේ රු. 38,522,959 ක් වන අතර, ඉතිරි මුදලින් රු.32,366,302 ක් නිදහස් කිරීමෙන් පසු වර්ෂය අවසානයට රු.172,503,194ක හිඟ බදු අය කිරීමට තිබුණි. |
| (ආ) වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය | |
| (i). ප.මූ.රී. 54.5 | (අ) කුරුණෑගල ආයුර්වේද රෝහල් භූමියේ දේශන ශාලාව අසල පිහිටි "සුදු හඳුන්" ගස 2014 ඔක්තෝබර් 30 දින රාත්‍රියේ කිසිවකු විසින් කැපීම සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාවක් 2015 දෙසැම්බර් 31 දින වන විටද ඉදිරිපත් කර නොතිබුණි.<br><br>(ආ) 2014 වර්ෂයේ අනතුරට ලක්වූ පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අංක 253 - 6639 දරන කැබ් රථයේ හානි හා පාඩු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණ අතර, වාහන 11 ක් 2015 වර්ෂය තුලදී හදිසි අනතුරුවලට ලක්වී තිබුණද මේ සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා හෝ පූර්ණ වාර්තා සකස් කර අළුත්වැඩියා වියදම හානි ලේඛනයේ හෝ ලිපිගොනුවේ ඇතුලත් කර නොතිබුණි.<br><br>(ඇ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක කේඑස් 8730 දරණ වාහනය අනතුරකට භාජනය වී තිබූ අතර, අලාභය සිදුවී මාස 03 කට පෙර පූර්ණ වාර්තාව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.148,298 ක අලාභය අයකර ගැනීමට නොහැකිවී තිබුණි.<br><br>(ඈ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අංක PE - 4121 දරණ රථයේ අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණ අතර, රථයේ අලුත්වැඩියා වියදම් ඇස්තමේන්තුව |

රු.4,500,000 ක් වුවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රු.3,960,000 ක රක්ෂණ වන්දියක් යටතේ අනුමැතිය ලබාදී තිබුණද, 2015 දෙසැම්බර් 31 දින දක්වාම අදාල රථය ගරාජයේ ගාල් කොට තිබුණි.

(ii). ප.මූ.රී. 54.6

කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් අංක 43-0672 දරන ගිලන් රථය හා අංක LW - 0425 දරන ගිලන් රථය අනතුරට පත්වී 2015 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් මාස 11 ක් හා මාස 09 ක් ගතවී තිබුණද අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

(iii). ප.මූ.රී. 59

පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි පොතෙන් අස්කිරීමේ නියෝගයක් ලබා නොගෙන ඖෂධ වර්ග 04 කින් කිලෝග්‍රෑම් 3 ග්‍රෑම් 150 ක ප්‍රමාණයක් කල් ඉකුත් වී තිබීම හේතුවෙන් පොත්වලින් කපා හැර තිබුණි.

(iv). ප.මූ.රී. 60

ආයතනය විසින් හානි හා පාඩු සඳහා ලේඛනයක් පවත්වා ගත යුතු වුවත්, වසර ගණනාවක සිට එවැනි ලේඛනයක් නඩත්තු කර නොමැති අතර, 2014 අප්‍රේල් 01 දින අංක KB - 0889 දරන රථයට සිදුවූ අනතුරින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට රු. 330,398 ක පාඩුවක් සිදුව තිබුණද, මේ පිළිබඳ විස්තර ලේඛනගත කර නොතිබුණි.

(v). ප.මූ.රී. 261.2.2

(අ) වැඩසටහන් සඳහා ලබාගන්නා අත්තිකාරම් අදාල කාර්යය අවසන් වූ වහාම පියවීම සිදුකල යුතු වුවත්, ගිරිඋල්ල සහ ඉබ්බාගමුව කලාපවල පිළිවෙලින් අවස්ථා 07 කදී සහ 08 කදී ලබාගත් රු.69,400 ක් සහ රු. 443,590 ක වටිනාකම් ඇති අත්තිකාරම් 2015 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණ අතර, ඉබ්බාගමුව කලාපයේ නිලධාරීන් 06 දෙනෙකුට ලබාදී තිබූ රු. 626,340 ක වටිනාකමැති අත්තිකාරම් දින 25 - 104 ත් අතර කාල ප්‍රමාදයක් සහිතව පියවා තිබුණි.

(ආ) කුලියාපිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ අවස්ථා 20 කදී නිලධාරීන් 11 දෙනෙකු වෙත ලබාදී තිබූ රු. 321,000 ක අත්තිකාරම් මුදලින් සියයට 48 ක් වූ රු. 154,600 ක මුදලක් අදාල කාර්යයට නොයොදවා මුදලින් පියවා තිබුණි.

(vi). ප.මූ.රී. 372

පේෂකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රවර්තන වර්ෂයේ ගිණුම් ඊළග එළඹෙන වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද , 2013 වර්ෂයට අදාල ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2015 මාර්තු 11 දිනදීය.

(vii). ප.මූ.රී. 379

පේෂකර්ම දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුම් කටයුතුවල අපේක්ෂිත කාරක පාඩු පියවීම සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.

(viii). ප.මූ.රී. 474

රජයේ සියළුම ආයතනවල ඇති භාණ්ඩවල හරිවැරදි බැලීම සඳහා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට ප්‍රථම භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර සමීක්ෂණය සිදුකල යුතු වුවද, 2015 පෙබරවාරි 09 දින සමීක්ෂණ මණ්ඩල පත්කර තිබූ අතර 2013 වර්ෂය සඳහා පාසල් 22 කද 2014 වර්ෂය සඳහා පාසල් 38 ක හා කොට්ඨාශ කාර්යාල 02 ක සමීක්ෂණ නිමකර නොතිබුණි. සමීක්ෂණය නිමකල පාසල් 80 න්ද පාසල් 21 ක වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ix). ප.මූ.රී. 476

සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ ඊට ආසන්න දිනයක භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර දෙසැම්බර් 31 දිනට භාණ්ඩවල හරි වැරදි බැලීම කලයුතු බව දන්වා තිබුණද, විගණිත දින වන 2016 ජනවාරි 31 වන විටත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) චක්‍රලේඛ

------------

(i). අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ

--------------------------

(අ) 2007 දෙසැම්බර් 13 දිනැති අංක FD/1/27/1/5/1/2007 හා අංක 2007/20 දරන චක්‍රලේඛයේ 3:2 ඡේදය

වඩාත් පහසු පාසල් වර්ගයට අයත් පාසලක උපරිම සේවා කාලය අවුරුදු 06 ක් වශයෙන් දක්වා තිබුණද, කලාප 08 කින් ලබාගත් තොරතුරු මත පාසල් 166 ක ගුරුභවතුන් 2565 ක් වසර 06 කට වඩා එකම පාසලේ සේවය කරන බව නිරීක්ෂණය විය.

(ආ) 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛය

1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පන්තියක උපරිම ළමුන් සංඛ්‍යාව 40 කට සීමා වියයුතු බව හා 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පන්තියක උපරිම ළමුන් සංඛ්‍යාව 45 කට නොවැඩි වියයුතු බව දක්වා තිබියදී මලියදේව ආදර්ශ මහා විද්‍යාලයේ 2015 වර්ෂයේදී එම සීමාවන් ඉක්මවා සිසුන් 181 ක් ඇතුළත් කර තිබුණි.

| | |
|---|---|
| (ඇ) 2013 මැයි 23 දිනැති අංක 23/2013 දරන චක්‍රලේඛය | එක් පන්තියකට ඇතුළත් කළ හැකි උපරිම සිසුන් සංඛ්‍යාව 40 ක් වුවත්, පාසල් 27 ක 2015 පෙබරවාරි 28 දින වන විට එම සීමාව ඇතුළත අදාල පංති වලට ඇතුළත් කර ගත හැකිව තිබූ සිසුන් 348 දෙනෙකු පොරොත්තු ලේඛණයට අනුව බඳවාගෙන නොතිබුණි. |

(ii). <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u>

| | |
|---|---|
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක: IAI/2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | කු/ පොතුබෝව මහා විද්‍යාලයේ සහ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පරිගණක සඳහා වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර ලේකම්ගේ අයවැය චක්‍රලේඛයේ 06 ඡේදය | 2015 වර්ෂය සඳහා සුභ පැතුම් පත් සහ ලිත් මුද්‍රණය දිනපතා පුවත්පත් මිලදී ගැනීම සහ ප්‍රධාන අමාත්‍යතුමාගේ ඡායාරූප මුද්‍රණය වැනි චක්‍රලේඛයට අනුකූල නොවන කටයුතු සඳහා එකතුව රු. 653,754 ක් වූ වියදම් දරා තිබුණි. |

(iii). <u>ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ</u>

| | |
|---|---|
| (අ) 2006 ජනවාරි 04 දිනැති අංක: සීඑස්ජ්/පී1/40 දරන චක්‍රලේඛය | වයඹ ප්‍රධාන අමාත්‍යාංශයෙන් ඉන්ධන දීමනාව ගෙවන නිලධාරියෙකුගේ වාහනයක් සඳහා ඇනවුම් 08 ක් මඟින් රු. 65,960 ක් වටිනා ඉන්ධන ලීටර් 600 ක් අනුමැතියකින් තොරව ලබාගෙන තිබුණි. |
| (ආ) 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන චක්‍රලේඛය, 2007 ඔක්තෝබර් 23 දිනැති අංක 23/2007 හා 2010 මැයි 24 දිනැති අංක 08/2010 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, 2015 ජූනි 04 දිනැති අංක එන්ඩබ්ලිව්පී/සීඑස්/ඒඩී/2/22 දරන ජනාධිපති ලේකම් අමතන ලද වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපිය | (i). ගරු පළාත් අමාත්‍යවරුන් ඇතුළු ධූරධාරීන් හා ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට ගෙවිය හැකි සංයුක්ත දීමනා සහ අතිකාල දීමනා සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ලබාදී නොතිබියදී, වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා 2015 වර්ෂය තුළ සංයුක්ත දීමනා ලෙස රු. 274,721 ක්ද, අතිකාල දීමනා ලෙස රු. 750,642 ක්ද ගෙවා තිබුණි.<br><br>(ii). ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අයත් නොවන නිලධාරීන් 08 දෙනෙකු සඳහා සංයුක්ත දීමනා ලෙස රු. 34,845 ක්ද අතිකාල දීමනා ලෙස රු. 132,066 ක්ද ගෙවා තිබුණි. |

(iv). රාජ්‍ය මුදල් චක්‍රලේඛ

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වයඹ පළාත් සභාවේ වාර්ෂික කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් පිළියෙල කර පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත්, එවැනි කාර්ය සාධන වාර්තාවක් සකස් කර සභාගත කර නොතිබුණි.

(v). මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ

(අ) 2010 ඔක්තෝම්බර් 11 දිනැති අංක මු.ක්‍ර.අ.01/2010/01 දරන චක්‍රලේඛය

විදේශ සංචාරවල යෙදී තිබුණු පළාත් සභා මන්ත්‍රීවරුන් 36 දෙනෙකු සඳහා සංයුක්ත දීමනා හා අනියම් දීමනා ලෙස සභා ලේකම් කාර්යාලය විසින් රු.1,757,114 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 30 දිනැති අංකපීඑෆ්ඩී/ආර්ඊඩී/01/04/ 2013/05 දරන චක්‍රලේඛය

චක්‍රලේඛයේ (vi) ඡේදය අනුව නිලධාරියෙකු මසකට අධික කාලයක් වැටුප් සහිත හෝ වැටුප් රහිත නිවාඩු ලබා සිටිනම් නිවාස හා ජංගම දුරකථන සඳහා දීමනා නොගෙවිය යුතු වුවත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ හා ගල්ගමුව රෝහලේ ප්‍රසූත නිවාඩු හා විදේශ නිවාඩු ලබා සිටි නිලධාරීන් 32 දෙනෙකුට රු. 494,625 ක මුදලක් නිවාඩු කාලය තුල දුරකතන දීමනා ලෙස ගෙවා තිබුණි.

(vi). වෙනත් චක්‍රලේඛ

2015 පෙබරවාරි 16 දිනැති අංක 02-88/2014 (i) දරන සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පොදු චක්‍රලේඛයේ 03 හා 05 ඡේද

අලව්ව ප්‍රාදේශීය රෝහලේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් දෙදෙනෙකු පිළිගත් ක්‍රමවේදයට පටහැනිව 2014 ජුනි 02 දින සිට පැමිණීම හා පිටවීම වෙනම අත්සන් ලේඛණයක සටහන් කර තිබූ අතර, දඹදෙනිය මූලික රෝහලේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවල නියැළුණු පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට චක්‍රලේඛයට පටහැනිව අතිකාල දීමනා වශයෙන් රු. 961,977 ක් ගෙවා තිබුණි.

(ඇ) <u>ආයතන සංග්‍රහය</u>

ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.5.4 වගන්තිය

කුරුණෑගල මහ නගර සභාවේ නියෝජ්‍ය නාගරික කොමසාරිස් 2014 සැප්තැම්බර් 05 දින සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා පත් කිරීම වෙනුවෙන් සහ වයඹ පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල, නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා 2015 අගෝස්තු 31 දින සිට 2015 නොවැම්බර් මස දක්වා පත් කිරීම හේතුවෙන් ඊට අයත් ආරම්භක වැටුපෙන් සියයට 25 ක් වැඩ බැලීමේ දීමනා ලෙස 2015 සැප්තැම්බර් දක්වා පිළිවෙලින් රු. 97,063 ක් හා රු. 32,134 ක් ගෙවිය යුතු වුවත් පිළිවෙලින් රු.114,230 ක් හා රු.39,086 ක් ගෙවීම නිසා වැඩිපුර රු.24,119 ක් ගෙවා තිබුණි.

2.2.9 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස කුඩා කර්මාන්ත අධ්‍යක්ෂවරයාට රු.367,550 ක මුදලක් ආපදා ණය ලෙස ලබා දී තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සඳහා විසර්ජන පනතින් බලය දී තිබූ වියදමෙහි උපරිම සීමාව රු. 11,220,787 කින් ඉක්මවා තිබුණි.

(ඇ) පුත්තලම් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම ගැනීමෙන් පසු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණු නිලධාරීන් දෙදෙනෙකුගේ වැටුප් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. නිළධාරීන් දෙදෙනාගේ කොන්ත්‍රාත් සේවයට පත් කිරීමේ ලිපියේ ඇතුලත් කොන්දේසි වලට පටහැනිව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුව වැටුප් සංශෝධනය කර 2006 ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා කාලය තුල විශ්‍රාම වැටුප් ලෙස රු.1,829,055 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) අධීක්ෂණ මන්ත්‍රීවරුන් ලෙස සේවය කිරීම වෙනුවෙන් ඉන්ධන දීමනා ගෙවීමට ප්‍රතිපාදන සලසා නොමැති වුවද, 2015 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු මස දක්වා වයඹ පළාත් සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට පළාත් අමාත්‍යාංශයක අධීක්ෂණ මන්ත්‍රීවරුන් ලෙස සේවය කිරීම වෙනුවෙන් මසකට රු.10,000 බැගින් රු.160,000 ක් ඉන්ධන දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඉ) 2008 දෙසැම්බර් 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 142 ප්‍රකාරව සභාපතිවරයාට, ආණ්ඩුපක්ෂ සංවිධායක සහ විපක්ෂ සංවිධායක යන අයට සංයුක්ත දීමනා, ඉන්ධන දීමනා හා දුරකතන දීමනා ගෙවීමට ප්‍රතිපාදන සලසා නොතිබියදී සභා ලේකම් කාර්යාලය විසින් ඒ සඳහා රු.1,115,000 ක මුදලක් ගෙවා තිබුණි.

## 3. ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පළාත් සභාවේ එක් එක් ආදායම් සංකේත යටතේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සමඟ සසඳා පහත දැක්වේ.

| ආදායම් සංකේත අංකය | ආදායම් විස්තරය | 2015 ඇස්තමේන්තුගත ආදායම | 2015 තථ්‍ය ආදායම | 2014 ඇස්තමේන්තුගත ආදායම | 2014 තථ්‍ය ආදායම |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන |
| 10.02, 10.03 | නිෂ්පාදනය හා වියදම මත බදු | 5,413.00 | 5,658.70 | 5,153.00 | 5,036.40 |
| 20.02 | බදු කුලී, පොලී, ලාභ හා ලාභාංශ | 180.00 | 187.16 | 252.00 | 184.67 |
| 20.03 | විකුණුම් හා ගාස්තු | 459.94 | 536.64 | 623.00 | 486.78 |
| 20.06 | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම | 10.00 | 0.20 | 27.00 | 11.77 |
| | එකතුව | 6,062.94 | 6,382.7 | 6,055.00 | 5,719.62 |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් මූල්‍ය රීති 41.1.4 වගන්තිය ප්‍රකාරව තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරින් කටයුතු නොකිරීම නිසා වැය විෂයයන් 11 කට අදාලව ඇස්තමේන්තු ආදායම නොඉක්මවූ තථ්‍ය ආදායම රු.598,277 සිට රු.366,222,570 ක් දක්වා එනම් සියයට 2.34 සිට සියයට 97.7 අතර පරාසයක් ගෙන තිබුණ අතර, ආදායම් විෂයයන් 08 කට අදාලව ඇස්තමේන්තුගත ආදායම ඉක්මවූ තථ්‍ය ආදායම රු.1,705,769 සිට රු.501,740,558 ක් දක්වා එනම් සියයට 4.26 සිට සියයට 275.19 අතර පරාසයකින් වැඩිවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ ගාස්තු හා ලැබීම්, ආයෝජන පොලී හා විවිධ ලැබීම් ආදායම් ශීර්ෂයන්ගේ ආදායම පිළිවෙලින් රු. 3,378,245ක්, රු. 9,020,913 ක් හා රු. 6,309,852 ක් වශයෙන් අඩුවී තිබුණි.

(ඇ) වර්ෂය ආරම්භයේදී පැවති රු.831,085 ක මෝටර් වාහන දඩ හිඟ ආදායම් වලින් සමාලෝචිත වර්ෂයේදී රු. 60,000 ක් පමණක් අයකර ගෙන තිබූ අතර, මෝටර් වාහන ආදායම් බලපත්‍ර හිඟ ආදායම වූ රු. 7,616,648 කින් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි.

(ඈ) වර්ෂය ආරම්භයේදී පැවති රු.76,554,598 ක දේපල පැවරීම මත මුද්දර බදු හිඟ ආදායමින් වර්ෂය තුළ අයකර ගෙන තිබුණේ රු. 23,253,600 ක් බැවින් වර්ෂය අවසානයට රු.60,496,965 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 1,400,467,030 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 44,909,677 ක් විය.

### 4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 4.2.1 ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආදායම් | | | | | | |
| බදු ආදායම් | 5,450.00 | 5,658.70 | (208.70) | 5,153.00 | 5,036.39 | 116.61 |
| බදු නොවන ආදායම් | 725.00 | 724.03 | 0.97 | 902.00 | 683.22 | 218.78 |
| රජයේ ප්‍රදාන | 25,017.38 | 24,417.02 | 600.36 | 20,672.10 | 19,393.21 | 1,278.80 |
| එකතුව | 31,192.38 | 30,799.75 | 392.63 | 26,727.10 | 25,112.82 | 1,614.20 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| <u>පුනරාවර්තන වියදම්</u> | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 22,213.90 | 21,859.94 | 353.96 | 17,263.00 | 16,999.31 | 263.69 |
| අනෙකුත් වියදම් | 5,486.51 | 4,828.78 | 657.73 | 4,856.50 | 4,199.26 | 657.24 |
| උප එකතුව | 27,700.41 | 26,688.72 | 1,011.69 | 22,119.50 | 21,198.57 | 920.93 |
| ප්‍රාග්ධන වියදම් | 3,401.92 | 2,710.56 | 691.36 | 4,067.70 | 3,869.33 | 198.37 |
| එකතුව | <u>31,102.33</u> | <u>29,399.28</u> | <u>1,703.05</u> | <u>26,187.20</u> | <u>25,067.90</u> | <u>1,119.30</u> |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ බදු හා බදු නොවන ආදායම්වල එකතුව රු.5,668,697,124 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම ආදායම රු.5,036,392,435 ක් වූයෙන්, මුළු ආදායම රු.632,304,689 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් රු.5,490,146,947 කින් වැඩිවී තිබුණි.

(i). සමාලෝචිත වර්ෂයේ වැටුප්, වේතන හා අනිකුත් සේවක ප්‍රතිලාභ සඳහා වියදම රු. 21,859,949,787 ක් වූ අතර ඉකුත් වර්ෂයේ වියදම රු.16,999,315,509 ක් වූයෙන් එම වියදම රු.4,860,634,278 කින් හෙවත් සියයට 29 කින් වැඩි වී තිබුණි.

(ii). අනිකුත් භාණ්ඩ හා සේවා සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම රු.1,809,621,789 ක් වූ අතර ඉකුත් වර්ෂයේ වියදම රු.1,688,881,659 ක් වූයෙන් රු.120,740,130 කින් හෙවත් සියයට 7 කින් වැඩි වී තිබුණි.

(iii). වෙනත් පුනරාවර්තන වියදම සමාලෝචිත වර්ෂයේදී රු.74,071,607 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී එය රු.34,263,176 ක් වූයෙන් එම වියදම රු.39,808,431 කින් හෙවත් සියයට 116 කින් වැඩි වී තිබුණි.

(ඇ) පළාත් සභා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු යටතේ ශීර්ෂ 14 කට අදාලව අවස්ථා 70 කදී මුළු ප්‍රතිපාදන වටිනාකම රු. 612,565,296 කින් රු. 468,613,584 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අතර, ශීර්ෂ 18 කට අදාලව අවස්ථා 63 කදී රු. 113,935,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයයන්ටද, අවස්ථා 125 කදී මුළු ප්‍රතිපාදනය රු. 524,930,000 කින් රු. 166,696,617 ක් වෙනත් වැය විෂයයන්ටද මාරු කර තිබුණි.

(ඈ) ශීර්ෂ 04 කට අදාලව අවස්ථා 08 කදී පරිපූරක මඟින් වෙන් කරගත් ප්‍රතිපාදන රු. 4,125,906 කින් රු. 2,159,913 ක් ඉතිරි කර තිබූ අතර, වැය විෂයයන් 06 කට රු. 2,920,311,000 ක් මාරු කර එයින් රු. 112,715,315 ක් ඉතිරි කර තිබුණි.

(ඉ) ප්‍රධාන ලේකම් කාර්යාලයේ එක් වැය විෂයයක් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.350,000,000 ක්ව තිබියදී පරිපූරකයන් මගින් රු.150,000,000 ක් ලබාගෙන අවස්ථා දෙකකදී රු.40,000,000 ක් වෙනත් වැය විෂයන්ට මාරු කර ඇතත්, සමාලෝචිත වර්ෂය තුලදී වැයකර තිබුනේ ඇස්තමේන්තු ප්‍රතිපාදනයට වඩා අඩු මුදලක් වන රු.30,132,536 ක මුදලකි.

(ඊ) වයඹ පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, සභා ලේකම් කාර්යාලය, පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය, අමාත්‍යාංශ 03 ක් සහ දෙපාර්තමේන්තු 08 ක වැය විෂයයන් 312 කින් 158 ක්

සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර රු.891,237,274 ක විචලනයට ඉදිරිපත් කරන ලද හේතු පිළිගත නොහැකි විය.

4.2.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ විශේෂ අවස්ථාවන්

ඉදිරිපත් කර ඇති තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන අයිතමයන්ගේ විශේෂ අවස්ථාවන් පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කෙරේ.

| අයිතමය | සමාලෝචිත වර්ෂය | ඉකුත් වර්ෂය | ඉකුත් වර්ෂය සමඟ වෙනස්වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| <u>මූල්‍යමය වත්කම්</u> | | | |
| මුදල් හා ආසන්න මුදල් | 3,650,178,880 | 2,360,858,419 | 54.61 |
| පළාත් රාජ්‍ය නිලධාරින්ට ණය | 907,238,026 | 876,987,398 | 3.45 |
| අනුමත අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ණය | 148,616,768 | 164,655,382 | 9.74 |
| මුළු මූල්‍ය වත්කම් | 4,706,033,674 | 3,402,501,199 | 38.31 |
| <u>වගකීම්</u> | | | |
| තැන්පතු හා වෙනත් වගකීම් | 512,122,412 | 609,056,968 | 15.91 |
| පවරාගත් ණය ශේෂ | 1,081,161 | 1,081,161 | - |
| | 513,203,573 | 610,138,129 | 15.88 |
| මුළු වගකීම් ඉක්මවූ මුළු වත්කම් ශේෂය | 4,192,830,101 | 2,792,363,070 | 50.15 |
| සමුච්චිත පළාත් සභා අරමුදල වර්ෂය | | | |
| ආරම්භයේ ශේෂය | 2,792,363,071 | 2,747,453,393 | 1.63 |
| වර්ෂයේ අයවැය අතිරික්තය | 1,400,467,030 | 44,909,677 | 3018.4 |
| වර්ෂය අවසානයේ ශේෂය | 4,192,830,101 | 2,792,363,070 | 60.89 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.1,081,161 ක පවරාගත් ණය ශේෂය වසර ගණනාවක් තිස්සේ ගිණුම්වල ඉදිරියට ගෙන එන ශේෂයක් ලෙස දක්වා තිබුණ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂයේ අයවැය අතිරික්තය ඉකුත් වර්ෂයේදී රු.44,909,677 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී එය රු.1,400,467,030 දක්වා සියයට 3018.4 කින් වැඩි වී තිබුණි.

4.2.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ විශේෂ අවස්ථාවක්

---

ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ විශේෂ අයිතමයන් පහත දක්වා ඇත.

| | අයිතමයන් | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| 1. | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 1,328,206,095 |
| 2. | ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 72,260,935 |
| 3. | මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (148,728,882) |
| 4. | ශුද්ධ මුදල් ප්‍රවාහය | 1,251,738,148 |
| 5. | වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් වලට සමාන දෑ | 1,281,812,838 |
| 6. | වර්ෂය අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ | 2,533,550,986 |

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂය ආරම්භයේ හා අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ සකස් වූ ආකාරය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් මගින් දක්වා නොතිබුණ අතර, දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් වලට සමාන දෑහි වටිනාකම රු.2,533,550,986 ක් වී තිබුණි.

(ආ) ශුද්ධ මුදල් ප්‍රවාහය ඉකුත් වර්ෂයේ රු.321,388,736 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී එය රු.1,251,738,148 ක් වුයෙන් රු.930,349,412 කින් වැඩි වී තිබුණි.

**4.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

---

පළාත් භාණ්ඩාගාර තැන්පතු ගිණුම යටතේ හානි හා පාඩු ලෙස ගිරිඋල්ල කලාප කාර්යාලයේ සිදුවූ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් කපාහැරීම සඳහා ලබාදුන් රු. 13,609,655 ක මුදල ආපසු අයකරගෙන නොතිබුණ අතර, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම වංචාවට මහජන බැංකුව නීත්‍යානුකූලව වගකිව යුතු බවට තීරණය වුවහොත් වගකිව යුතු බැංකුවක් ලෙස එම අලාභය ගෙවීමට කටයුතු කරන බව 2011 ජූනි 30 දින දන්වා තිබුණි.

**5. අධිකාරි ගිණුම්/ අරමුදල් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්**

---

**5.1 අධිකාරි ගිණුම්/ අරමුදල් ගිණුම්**

---

(අ) විගණන මතය

---

වයඹ පළාත් සභාවේ ස්ථාපිත අධිකාරි 09 සඳහා තත්ත්වාගණනය කළ විගණන මතයන් ඉදිරිපත් වූ අතර අරමුදල් 05 න් 04 ක් සඳහාද තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කෙරුණි. එක් අරමුදලක් සඳහා පමණක් තත්ත්වාගණනය නොකළ විගණන මතයක් ඉදිරිපත් කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ එක් එක් අධිකාරියේ/ අරමුදලේ සමස්ථ මූල්‍ය ප්‍රතිඵලය පහත සඳහන් පරිදි නිරීක්ෂණය වුණි.

| අධිකාරියේ නම | සමස්ථ ආදායම | සමස්ථ වියදම | ශුද්ධ ප්‍රතිලාභය (ඌණතාවය)/ අතිරික්තය | සමස්ථ ආදායමට ශුද්ධ ප්‍රතිඵලය ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| යන්ත්‍රෝපකරණ අධිකාරිය | 61,399,710 | 103,080,178 | (41,680,468) | (67.88) |
| පළාත් පරිසර අධිකාරිය | 21,863,004 | 20,000,600 | 1,862,404 | 8.51 |
| වයඹ සංවර්ධන අධිකාරිය | 17,347,912 | 21,098,569 | (3,750,657) | -(21.6) |
| පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය | 19,620,523 | 25,803,997 | (6,183,474) | (31.5) |
| කර්මාන්ත සේවා කාර්යාංශය | 84,253,211 | 81,896,033 | 2,357,178 | 2.79 |
| මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | 93,370,320 | 90,361,124 | 3,009,196 | 3.22 |
| මානව සම්පත් සංවර්ධන අධිකාරිය | 159,636,622 | 156,040,893 | 3,595,729 | 2.25 |
| ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය | 6,861,901 | 4,681,455 | 2,180,446 | 31.7 |
| වයඹ ජනකලා පදනම | 43,738,487 | 43,644,603 | 93,884 | 0.21 |
| ප්‍රධාන අමාත්‍ය අරමුදල | 2,000,000 | 4,319,892 | (2,319,892) | -(116) |
| ක්‍රීඩා අරමුදල | 242,928 | 149,116 | 93,512 | 38.49 |
| පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල | 2,362,767 | 959,420 | 1,403,347 | 59.39 |
| වයඹ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල | 3,186,330 | 3,047,140 | 139,190 | 4.36 |
| වයඹ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 65,110,387 | 45,184,231 | 19,926,156 | 30.6 |

(ඇ) මූල්‍ය තත්ත්වය

සමාලෝචිත වර්ෂයේ එක් එක් අධිකාරියේ මූල්‍ය තත්ත්වය අනුපාත වශයෙන් පහත සඳහන් පරිදි නිරීක්ෂණය විය.

| අධිකාරියේ නම | ජංගම නොවන වත්කම් | ජංගම වත්කම් | ජංගම වගකීම් | සමුච්චිත අරමුදල | දිගුකාලීන ණය | ජංගම අනුපාතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | % |
| යන්ත්‍රෝපකරණ අධිකාරිය | 39,069,773 | 45,299,539 | 46,179,076 | 42,451,500 | 14,761,736 | 0.9 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පළාත් පරිසර අධිකාරි | 59,637,010 | 12,405,244 | 1,261,641,668 | 57,175,512 | - | - |
| වයඹ සංවර්ධන අධිකාරිය | 48,395,570 | 6,091,528 | 6,165,001 | 13,437,786 | - | 0.9 |
| පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය | 18,148,146 | 10,799,811 | 5,200,130 | (8,675,467) | 3,383,181 | 2.0 |
| කර්මාන්ත සේවා කාර්යාංශය | 67,099,508 | 88,439,332 | 22,849,033 | 110,415,387 | 22,274,421 | 3.8 |
| මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | 48,780,019 | 21,433,265 | 43,411,291 | 23,838,445 | - | 0.4 |
| මානව සම්පත් සංවර්ධන අධිකාරිය | 21,242,324 | 259,060,381 | 64,020,235 | 216,282,468 | - | 4.0 |
| වයඹ ජනකලා පදනම | 9,074,447 | 22,811,820 | 1,708,685 | 20,388,756 | - | 13.3 |
| ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය | 56,179,038 | 11,320,044 | 7,033,880 | (67,243) | - | 1.6 |
| ප්‍රධාන අමාත්‍ය අරමුදල | 5,261,426 | 1,015,023 | 111,000 | 3,223,914 | - | 9.1 |
| ක්‍රීඩා අරමුදල | 259,985,160 | 4,587,037 | 36,106 | 262,054,772 | - | 127.0 |
| පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල | - | 1,403,347 | - | 1,403,347 | - | - |
| වයඹ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල | 9,000,000 | 1,614,082 | 586,000 | 139,190 | - | 2.7 |
| වයඹ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 250,411,719 | 11,744,021 | 1,825,383 | 262,165,742 | - | 6.4 |

(ඇ) විගණන නිරීක්ෂණ

----------------------

(i). වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය

-----------------------------------

(අ) වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ පසුගිය වර්ෂ 05 ක මූල්‍ය ප්‍රකාශන අනුව, එකතුව රු.64,476,157 ක අලාභයක් නිරීක්ෂණය වූයෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පැවතුණි.

(ආ) පිරිවැය එකතුව රු.10,190,290 ක් වූ වාහන හා යන්ත්‍ර උපකරණ 05 ක් වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය වර්ෂ ගණනාවක සිට සුළු සේවා කටයුතු නොකිරීම හෝ සේවා සඳහා අවශ්‍ය අමතර උපාංග ලබා නොගැනීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය සතු යන්ත්‍ර හා රථ වාහන සඳහා ප්‍රමාණවත් සේවා ඉල්ලුමක් ලබා ගැනීමට සැලසුම් පිළියෙල නොකිරීම හේතුවෙන් පිරිවැය/ (ප්‍රත්‍යාගණිත) වටිනාකම රු.15,643,685 ක් වූ රථවාහන 06 ක් වසර ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ii). වයඹ සංවර්ධන අධිකාරිය

-----------------------------

පසුගිය වර්ෂ 05 ක වයඹ සංවර්ධන අධිකාරියේ ප්‍රාග්ධන ගිණුම විශ්ලේෂණය කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ප්‍රාග්ධනය රු.8,650,103 කින් අඩුවී පැවති බැවින් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

(iii). පරිසර අධිකාරිය

-------------------

පරිසර අධිකාරිය විසින් ණයහිමියන් ලෙස රු.5,523,280 ක් දක්වා තිබූ අතර ඉන් රාජ්‍ය ආයතන 04 ක් සඳහා ගෙවිය යුතු රු.704,643 ක් 2016 මාර්තු දක්වා නිරවුල් කර නොතිබුණි.

(iv). පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

-------------------------------------------

පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 23 ක් සඳහා පාරිතෝෂික වශයෙන් 2015 දෙසැම්බර් 31 වන විට රු.3,520,630 ක් වෙන්කර වෙනම ගිණුමක තැන්පත් කර පවත්වා ගතයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

(v). කර්මාන්ත සේවා කාර්යාංශය

-------------------------------

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු රු.1,049,254 ක් වූ උපයන විට ගෙවීම් බදු 2015 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) උපචිත සේවක අර්ථ සාධක අරමුදල් ගිණුමේ ආරම්භක ශේෂය ලෙස දක්වා තිබූ රු. 349,535 ක මුදලින් 2015 වර්ෂය තුළ ගෙවා තිබුණේ රු. 276,199 ක මුදලක් පමණි.

(ඇ) උපචිත සේවක භාරකාර අරමුදල් ගිණුමේ ආරම්භක ශේෂය ලෙස දක්වා තිබූ රු. 125,702 ක මුදලින් 2015 වර්ෂය තුළ ගෙවා තිබුණේ රු. 37,663 ක මුදලක් පමණි.

(vi). ප්‍රධාන අමාත්‍ය අරමුදල

--------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ආදායම ඉක්ම වූ වියදම රු.2,319,892 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේදී වියදම ඉක්මවූ ආදායම රු.3,224,000 ක් වූයෙන් පවතින ආදායම් ඉක්මවා රෝගීන් සඳහා ආධාර ලබාදී තිබෙන බව නිරීක්ෂණය විය.

## 5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

-----------------------------

### 5.2.1 ගිණුම් ඉදිරිපත් කිරීම

--------------------------

සමාලෝචිත වර්ෂයට අදාල පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(අ) අමුද්‍රව්‍ය සැපයීම ඇතුළුව පේෂකර්ම වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය - 2014 හා 2015 වර්ෂ

(ආ) අමුද්‍රව්‍ය සැපයීම ඇතුළුව කාර්මික වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය - 2015 වර්ෂය

(ඇ) කාර්මික පාසැල් පවත්වා ගෙන යාම - 2015 වර්ෂය

**6. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**6.1 කාර්ය සාධනය**

**---------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

6.1.1 ආයුර්වේද දෙපාර්තමේන්තුවට අවශ්‍ය ඖෂධ වර්ග ආයුර්වේද නිෂ්පාදනාගාරයේ නිපදවීමට හැකියාව තිබියදී ඖෂධ වර්ග 15 ක් ඖෂධ සංස්ථාවෙන් මිලදී ගැනීම නිසා 2015 වර්ෂය තුල රු.1,519,500 ක අමතර වියදමක් දැරීමට සිදුවී තිබුණි.

6.1.2 වයඹ පළාත් සමුපකාර දෙපාර්තමේන්තුවට අයත් කුරුණෑගල, කුලියාපිටිය හා හලාවත යන උපකාර්යාලවල 2015 ඇවර කිරීමට තිබුණු සමිති සංඛ්‍යාව 376 ක් වූ අතර, ඇවරකරුවන් පත්කල සමිති සංඛ්‍යාව 23 ක් වූයෙන් 2015 ඇවර කිරීමට තිබෙන මුළු සමිති සංඛ්‍යාව 399 ක් විය. නමුත් මෙම සමිතිවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඇවර කිරීමේ කටයුතු අවසන් කල සමිති සංඛ්‍යාව 46 ක් විය.

6.1.3 හලාවත හා කුලියාපිටිය සමුපකාර සංවර්ධන උපකොමසාරිස් බලප්‍රදේශය තුල පිහිටි විවිධ සමුපකාර සමිති බොහොමයක විගණනය අවසන් කර වාර්තා කාර්යාලයට භාරදී තිබුණද ඉන් වාර්තා 76 ක් සමාලෝචනය කර අදාල සමුපකාර සමිතිවලට නිකුත් කිරීමේදී මාස 02 සිට මාස 07 දක්වා කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. තවද 2015 දෙසැම්බර් වන විට විගණනය අවසන්වී මාස 03 කට වැඩි කාලයක් ගතවී තිබුණ කුලියාපිටිය සමුපකාර සහකාර කොමසාරිස් කාර්යාලයේ විගණන වාර්තා 20 ක් සමාලෝචනය සඳහා භාරදී නොතිබුණි.

6.1.4 පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාබනික පොහොර නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථාන 03 ක් ඉදිකිරීම සඳහා 2015 වර්ෂයේදී රු. 2,461,899 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. නමුත් කුලියාපිටිය හා නිකවැරටිය ප්‍රදේශයේ අලෙවි මධ්‍යස්ථාන 02 ක් පමණක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර, එම ඉදිකිරීම් කටයුතුද 2015 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර නොතිබුණි.

6.1.5 ගල්ගමුව මූලික රෝහල නවීකරණ කටයුතු 2015 වර්ෂය අවසාන වන විට නිම කිරීමට අපේක්ෂිතව පැවතියද, අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩල සැසඳීමේදී තනතුරු 27 ක පුරප්පාඩු 148 ක් පැවතීම හේතුවෙන් නවීකරණය තුලින් බලාපොරොත්තුවන අරමුණු ඉටුකල නොහැකි වී තිබුණි.

6.1.6 පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට ජලභීතිකා රෝගය පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් වෙනුවෙන් රු.100,000 ක ප්‍රතිපාදනයන් වෙන් කර තිබුණද, 2015 වර්ෂයේදී එම ප්‍රතිපාදනයෙන් වැය කර තිබුණේ සියයට 55 ක් එනම් රු. 54,675 ක් පමණි.

## 6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

6.2.1 සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත්, විශේෂ වෛද්‍ය ආධාර සහ වකුගඩු ආධාර ගෙවීමේදී 2015 අප්‍රේල් 08 දින වන්දි කමිටුව මඟින් අනුමැතිය දී තිබුණු පුද්ගලයින් 673 කට ගෙවිය යුතු රු.582,500 ක විශේෂඥ වෛද්‍යාධාර සහ වකුගඩු ආධාර විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 16 දින වන විටත් ගෙවා නොතිබුණි.

6.2.2 2015 වර්ෂය සඳහා පේෂකර්මාන්ත ගම්මාන ආරම්භ කිරීමේ විශේෂ ව්‍යාපෘතිය යටතේ ගම්මාන 04 ක් ආරම්භ කිරීම සඳහා සැලසුම් කර රු.මිලියන 4.92 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද 2015 දෙසැම්බර් 31 දින වන විටත් එක් පේෂ කර්මාන්ත ගම්මානයක් පමණක් ආරම්භ කර තිබුණි. එසේ වුවද, යෝජිත පේෂකර්ම ගම්මාන 04 ට ලබා දීම සඳහා රු. 990,000 ක නූල් තොගයක් වර්ෂය තුලදී මිලදී ගෙන තිබුණු අතර, එයින් 2015 දෙසැම්බර් 31 දින වන විට මකුල් වැව පේෂකර්ම ගම්මානය සඳහා පමණක් රු.144,403 ක නූල් තොග ලබා දී තිබුණි.

6.2.3 2012, 2013, 2014 සහ 2015 යන වර්ෂ තුල ගොඩවෙල අලෙවි මධ්‍යස්ථානයේ ණය පදනම මත අලෙවි කල රෙදි පිළි සඳහා 2015 දෙසැම්බර් 31 දින වන විට අයවීම් හිඟ හිටි ණය ශේෂය රු. 892,310 ක් වී තිබුණි.

6.2.4 2015 වර්ෂයේ දී ගොඩවෙල ජල පිරිපහදු ඒකකය ස්ථාපිත කිරීම සඳහා රු.5,356,000 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, එයින් රු.2,678,000 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දින පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.

6.2.5 2014 වර්ෂයේ ප්‍රතිපාදන මඟින් මිලදී ගෙන යටිවල ස්වශක්ති ග්‍රාම සංවර්ධන සමිතියට ලබා දී තිබූ රු.39,000 ක් වටිනා මැටි අඹරන යන්ත්‍රය 2015 දෙසැම්බර් 09 වන විගණන දින වන විටත් මෝටරයක් නොමැති බැවින් භාවිතයට ගෙන නොතිබුණි.

6.2.6 නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් අවස්ථා 04 කදී අයකළ මත්පැන් බලපත්‍ර මුද්දර ගාස්තු රු.140,000 ක් අදාල පාර්ශවයන් වෙත යවා නොතිබුණි. මීට අමතරව අවස්ථා 03 කදී තැන්පත් කළ රු.38,600 ක වන අලි වගා හානි වන්දි මුදල් අදාල පාර්ශවයන් වෙත නොගෙවා වසර 01 ½ ක කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

6.2.7 ශ්‍රී ලංකා ටෙලිකොම් මධ්‍යස්ථානය හා දුරකථන සම්ප්‍රේෂණ කුළුණ පිහිටි බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රජයේ ඉඩම දීර්ඝ කාලීන බදු බලපත්‍රයක් යටතේ බදුදීමට කටයුතු කර නොතිබීමෙන් රජයට අයවිය යුතු බදු ආදායම් අහිමි වී තිබුණි.

6.2.8 පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික සමාගමක් විසින් භුක්ති විදින අක්කර 04 රූඩ් 03 පර්චස් 37 ක ඉඩම හා රූඩ් 01 යි පර්චස් 28 ක අනවසරයෙන් භුක්ති විඳින ඉඩම සඳහා වසර 12 කට ආසන්න කාලයක සිට දිගු කාලීන බදු ගිවිසුමකට ඇතුළත්ව බදු මුදල් අයකර නොතිබුණි. කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාදැල්පොල ග්‍රාම නිලධාරී වසමේ පර්චස් 20 ක රජයේ ඉඩමක වසර 13 ක පමණ කාලයක සිට සමූපකාර සමිති ගොඩනැගිල්ලක් ඉදිකර බැංකු කටයුතු සිදුකළද, මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝ කාලීනව බදුදීමක් සිදුකර නොතිබීමෙන් වාර්ෂිකව ලැබිය යුතු බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි. එමෙන්ම පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අක්කර 09 රූඩ් 01 පර්චස් 8.42 ක ඉඩම් පෞද්ගලික ආයතන 04 ක් වෙත දිගු කාලීන බදු ලෙස ලබාදී ඇතත්, එයට විධිමත් අනුමැතියක් ලැබී නොතිබීම නිසා රජයට අයවිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි.

6.2.9 2015 නොවැම්බර් 17 දින ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා හා ගබඩා ලෙජර භෞතික පරීක්ෂාවේදී නිල ඇඳුම් සඳහා මිලදී ගත් කලිසම් හා කමිස රෙදිවල මීටර් 11.9 ක අතිරික්තයක් හා සාරි රෙදිවල මීටර් 32.4 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

6.2.10 කුරුණෑගල ආයුර්වේද රෝහල් නිෂ්පාදනාගාරය පිළිබඳ භෞතික පරීක්ෂාවේදී රු.354,064 ක් වටිනා ඖෂධ වර්ග 13 ක් වියලි ඖෂධ ගබඩාවෙන් හා ප්‍රධාන ගබඩාවෙන් තොග වශයෙන් නිකුත්කර තිබුණු ඖෂධ ලේඛණවලට ඇතුලත්කර නොතිබුණි.

6.2.11 කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 04 ක් 2008, 2012 හා 2013 වර්ෂවල සිට යන්ත්‍රෝපකරණ අධිකාරියේ ගාල්කර තිබූ අතර, එම වාහන වෙන්දේසි කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර දිරාපත්වීමට ඉඩ හැර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

6.2.12 අදාල කාර්යය අවසන් වීමෙන් පසුවත් අවස්ථා 14 කදී ඉතිරි වූ එකතුව රු. 420,662 ක මුදලක් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ආපසු යැවීමට හෝ රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

6.2.13 අයවැය ලේඛණය මඟින් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර වෙන් කර තිබූ රු. 2,450,000 ක මුදල් අදාල කාර්යයන් සඳහා යෙදවීමට කු/ ශාන්ත ආනා විද්‍යාලයේ අංශ ප්‍රධානීන් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව නිසි පියවර ගෙන නොතිබුණි.

6.2.14 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු කලාප 06 කට අයත් පාසල් 320 ක සිටිය යුතු ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙනුවට පහල ශ්‍රේණියක නිලධාරින් රාජකාරි ඉටු කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. එසේම එම කලාප 06 ට අයත් පාසල් 152 ක සිටිය යුතු ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙනුවට ඉහල ශ්‍රේණියක ශ්‍රේණිධාරීන් රාජකාරි ඉටු කරන අවස්ථාද පැවතුණි. තවද පාසල් 90 ක නියෝජ්‍ය විදුහල්පතිවරු අවශ්‍ය නොවන පාසල්හි නියෝජ්‍ය විදුහල්පති රාජකාරි ඉටුකිරීමත්, නියෝජ්‍ය විදුහල්පතිවරු සිටිය යුතු පාසල් 66 ක නියෝජ්‍ය විදුහල්පතිවරු සේවය කර නොතිබූ බවත් අනාවරණය විය.

6.2.15 කුලි/ කිතලව පුගල්ල මහා විද්‍යාලයේ අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 05 දෙනෙකු වුවද, සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනධ්‍යයන කාර්ය මණ්ඩලය 08 දෙනෙකු සේවයේ යෙදී ඇති බව නිරීක්ෂණය විය. එසේම අනුමත නොමැති තනතුරුවලට අදාල සේවකයින් දෙදෙනෙකු පාසලට අනුයුක්ත කර 2015 දෙසැම්බර් 31 දිනට වැටුප් වශයෙන් රු. 646,440 ක මුදලක් ගෙවා තිබුණි.

6.2.16 ඉබ්බාගමුව කලාපයට අයත් පාසල්වල නිල නිවාස 48 ක් තිබෙන නමුත් ඉන් 05 ක පමණක් නිලධාරීන් පදිංචි වී තිබූ අතර, මෙයින් භාවිතා කල හැකි නිල නිවාස 02 ක්ද ඉවත් කල යුතු නිල නිවාස 02 ක්ද පැවතුනි. ඉතිරි නිල නිවාස 44 ම අලුත්වැඩියා කල යුතු තත්ත්වයේ පැවතුණි.

6.2.17 දඹදෙනිය රෝහලට අයත් නිල නිවාස 05 කින් පදිංචි වූ දිනයේ සිටම නිවාස කුලී අයකර නොතිබුණි.

6.2.18 ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් නිල නිවාස වෙනුවෙන් ලේඛනයක් හා ලිපිගොනුවක් නඩත්තු කර නොතිබුණි. පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංක පළාත්/ඉකො/ආ1 හා 2015 නොවැම්බර් 17 දිනැති ලිපිය මඟින් නිල නිවාස 25 ක් ඇති බවත්, නිවාස 17 ක් භාවිතා කළහැකි මට්ටමේ හා 8 ක් අබලන්ව ඇති බවත් හඳුනාගෙන තිබුණි. භාවිතා කළහැකි මට්ටමේ නිවාස 11 ක් රාජ්‍ය නිලධාරීන්, කාන්තා සමිති හා පෙර පාසල් සඳහා ලබාදී තිබූ අතර, නිවාස 06 ක් නිශ්කාර්යව පැවතුණි.

6.2.19 ආණමඩුව ජනපද නිලධාරී නිල නිවසෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් පක්ෂ කාර්යාලයක් පවත්වාගෙන ගොස් තිබූ අතර, 2008 අගෝස්තු 24 දින එය ගිනි තබා තිබුණි. 2015 මාර්තු 02 දිනැති පුත්තලම දිස්ත්‍රික් සහකාර පොලිස් අධිකාරීවරයා විනාශ වූ නිල නිවාසයට අදාලව රු.559,355 ක තක්සේරු වාර්තාවක් ආණමඩුව ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ලබාගෙන තිබූ නමුත් 2015 දෙසැම්බර් මාසය දක්වාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

6.2.20 පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි ලංකා සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයකින් සුරාබදු බලපත්‍ර දෙකක් ලබාගෙන තිබුණද, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව අයවිය යුතු සංශෝධිත ගාස්තු රු.150,000 ක මුදල අයකර නොතිබුණි.

6.2.21 පොල්පිතිගම, වාරියපොල, නිකවැරටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සමාලෝචිත වර්ෂයේ හිඟ එළදා බදු රු.509,449 ක්ද, වාර්ෂික බදු රු.11,436 ක්ද, හිඟ දිගු කාලීන බදු රු.898,720 ක්ද අයකරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6.2.22 පොල්පිතිගම, අලව්ව හා පඩුවස්නුවර (නැගෙනහිර) යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2015 පළාත් ආයෝජන වැඩසටහන යටතේ අඩු ආදායම් ලාභීන්, ස්වයං රැකියා නියුක්තිකයන් හා ස්වේච්ඡා සංවිධානවලට බෙදාදීමට මිලදී ගත් රු.1,458,216 ක් වටිනා භාණ්ඩ බෙදා නොහැර ගබඩාවේ රඳවා තිබුණි.

6.2.23 ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අක්කර 05 රූඩ් 02 පර්චස් 17 ක ඉඩමක් 1995 ජූනි 15 දින පෞද්ගලික පාර්ශවයකට බදු දී තිබුණද, 2012 වර්ෂයේ සිට හිඟ බදු මුදල වූ රු.313,179 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

6.2.24 පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි අක්කර 02 රූඩ් 02 පර්චස් 11 ක ඉඩමක් පෞද්ගලික සමාගමක් වෙත වයඹ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා විසින් 1992 මාර්තු 24 දින සිට දීර්ඝ කාලීන බද්දට ලබාදී තිබුණද, බදුකරු විසින් 2002 වර්ෂයේ සිට කිසිදු බදු මුදලක් ගෙවා නොතිබුණි.

6.2.25 2015 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කළුගල් කැණීම් ව්‍යාපෘති 03 ක් සඳහා පමණක් බලපත්‍ර ලබාදී තිබුණද, තවත් ව්‍යාපෘති 26 ක් බලපත්‍ර ලබා නොගෙන අනවසරයෙන් පවත්වාගෙන යන බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.

**6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

6.3.1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සුළු හා මධ්‍ය පරිමාණ පතස් ඉදිකිරීම ව්‍යාපෘතිය යටතේ පතස් ඉදිකිරීමේදී බැම්ම සේදීයාම වැලැක්වීම සඳහා පිඩලි ඇල්ලීම හා පතසෙන් ජලය ලබාගතහැකි වන පරිදි අක්කර භාගයක පමණ භූමියක වෙළඳ භෝග වගාකළ යුතුව තිබුණි. එම අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොතිබියදී වාරියපොල කලාපයේ ප්‍රතිලාභීන් දෙදෙනෙකුට රු.100,000 ක්ද, ඉබ්බාගමුව කලාපයේ ප්‍රතිලාභීන් 05 දෙනෙකුට රු.250,000 ක්ද, ආණමඩුව කලාපයේ ප්‍රතිලාභීන් 04 දෙනෙකුට රු.200,000 ක්ද ගෙවා තිබූ බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

6.3.2 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාංශු හා ජල සංරක්ෂණ වැටි ඉදිකිරීම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වැටිවල ග්ලිරිසීරියා හා සැවැන්දරා පැල සිටවිය යුතු වුවද, එම අවශ්‍යතා සම්පූර්ණ නොකර ඉබ්බාගමුව කලාපයේ එක් ප්‍රතිලාභියෙකුට රු.30,000 ක්ද, ආණමඩුව කලාපයේ පුද්ගලයින්

දෙදෙනෙකුට රු.11,000 ක්ද, වාරියපොල කලාපයේ 5 දෙනෙකුට රු.33,985 ක්ද ගෙවා තිබූ බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

6.3.3 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව භෝග නිෂ්පාදන සමිති පිහිටුවීම ශක්තිමත් කිරීම ක්‍රමානුකූල කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.2,200,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, 2015 නොවැම්බර් 30 දිනට රු.1,256,266 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

6.3.4 වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද කර්මාන්ත 10 ට අදාල ලිපිගොනු පරික්ෂාවේදී ප්‍රතිපාදන රු. 70,094,738 ට සාපේක්ෂව වැඩිපුර කරන ලද වැඩ වටිනාකම රු. 28,098,610 ක් වූයෙන් එය සමස්ථ ඇස්තමේන්තු වටිනාකමින් සියයට 40 ක් වූ නමුත් එය ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ අනුමත කර නොතිබුණි.

6.3.5 වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී නියමිත බල අධිකාරිය ඉක්මවීම වැලැක්වීම පිණිස තෝරාගත් රු. 38,132,879 ක් වටිනා කොන්ත්‍රාත් 10 ක් අදියර කීපයකට බෙදා ඇස්තමේන්තු සකස් කර මිල කැඳවීම් කර එකම කොන්ත්‍රාත්කරුවකුට ලබාදී තිබුණි.

6.3.6 පේෂකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වූ පුහුණුවන්නන් පුහුණු කිරීමේ කටයුත්ත සඳහා 2013 වර්ෂයේදී සිසුන් 195 ක් බඳවා ගෙන පුහුණු දීමනා වශයෙන් රු.7,029,358 ක් ගෙවා තිබුණද, මෙම සිසුන් පුහුණු කාල සීමාවෙන් පසු නිෂ්පාදන කටයුතු සඳහා ආයතනයේ රැඳී නොමැති බව නිරීක්ෂණය විය.

**6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**---------------------------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

6.4.1 අංක.PE 9966 දරණ සංචිත වාහනය වාහන විෂයය භාර නිලධාරි විසින් රජයේ නිවාඩු දින සහ ඔහු පෞද්ගලිකව නිවාඩු ලබාගෙන තිබූ දිනයන් ඇතුලත් අවස්ථා 7 කදී කිලෝමීටර් 984ක දුර ධාවනය කර තිබුණි. එම දිනවලට අදාලව අතිකාල, ඉන්ධන ගමන් වියදම් වශයෙන් එකතුව රු.24,423 ක වියදමක් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් දරා තිබුණි.

6.4.2 2013 දෙසැම්බර් 23 සිට 2015 සැප්තැම්බර් 09 දක්වා කාලය තුළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කළ ළමා අපචාර පිළිබඳ මූලික විමර්ශන සම්බන්ධයෙන් විනය නියෝග ලබා දීම මාස 05 සිට මාස 25 දක්වා කාලයක් ප්‍රමාද වී තිබූ බැව් විගණන නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

6.4.3 2014 වර්ෂයේදී සභා ලේකම් කාර්යාලය විසින් චීන තායිලන්ත අධ්‍යයන වැඩ සටහන සහ සිංගප්පූරු තායිලන්ත අධ්‍යයන වැඩසටහන සඳහා විදේශගත වූ 25 දෙනෙකු සඳහා ගුවන්ටිකට් ගාස්තු, වීසා ගාස්තු, ආහාර පාන නවාතැන් හා ප්‍රවාහන ගාස්තු සඳහා රු.4,676,995 ක මුදලක් අධ්‍යයන වැඩ සටහනෙහි සත්කාර ආයතනය වෙත ගෙවා තිබුණි. නැවතත් එම 25 දෙනාට රු 5,013,100 ක මුදලක් වියදම් පියවා ගැනීම වෙනුවෙන් 2014 ඔක්තෝබර් මාසයේදී ගෙවා තිබුණි.

6.4.4 අලව්ව ප්‍රාදේශීය රෝහලේ වෛද්‍යවරයෙකු 2015 ජූනි 19 සිට විධිමත් දැනුම්දීමකින් තොරව සේවයට වාර්තා කර නොතිබුණි. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලීය ලිපිගොනු අනුව මෙම නිලධාරියාට 2015 ජූනි 24 දින සිට 2015 ජූලි 02 දින දක්වා විදේශ නිවාඩු අනුමත කර තිබුණද විගණන දිනය වූ 2015 අගෝස්තු 04 දින වන විටත් සේවයට වාර්තා කර නොතිබුණි.

6.4.5 වාරියපොල රෝහල සඳහා අනුමත දන්ත වෛද්‍යවරුන් සංඛ්‍යාව එක් අයෙකු වුවද දන්ත වෛද්‍යවරුන් දෙදෙනෙකු සේවයේ යොදවා තිබියදීත් 2014 දෙසැම්බර් සිට 2015 ජූලි දක්වා කාලය තුළ පැය 864 ක් සඳහා රු.448,797 ක් අතිකාල දීමනා වශයෙන් ගෙවා තිබුණි.

6.4.6 ගල්ගමුව මූලික රෝහලේ රෝගී ආහාර සඳහා 2015 වර්ෂයේදී කැලි කපන ලද ලොකු මාළු සපයා නොතිබුණද, ගෙවීම් සිදු කිරීමේදී පරා, තෝරා, කෙලවල්ලා යන ලොකු මාළු සඳහා ජනවාරි සිට ජූලි දක්වා කාලයට රු.189,287 ක් ගෙවා තිබුණි.

6.4.7 පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට 2013 මැයි මාසයේදී මිලදීගත් වටිනාකම රු.1,050,000 ක් වූ අංක 57 – 5608 දරන නිසාන් වර්ගයේ කැබ් රථය ගිනිගෙන විනාශ වී තිබුණද, ලිපිගොනුව අනුව මුදල් රෙගුලාසි ප්‍රකාර කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. මේ සඳහා රක්ෂණය වෙතින් හානි පූර්ණයක්ද සිදුවී නොතිබූ අතර, වාහනය මාවතගම පෞද්ගලික ගරාජයක් වෙත අළුත්වැඩියාව සඳහා භාරදී වසර 2 කට ආසන්න කාලයක් ගතවී ඇතත් අලුත්වැඩියාව අවසන් කර වාහනය ගෙන්වා ගෙන නොතිබුණි.

6.4.8 කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් අංක 42 – 0632 දරන ගිලන් රථය 2011 වර්ෂයේදී රු.148,580 ක ඇස්තමේන්තුගත මුදලකට අලුත්වැඩියාව සඳහා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත යවා තිබුණි. අළුත්වැඩියාව සිදු කරගෙන යාමේදී යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් රු.234,220 ක අමතර ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමත්, ඒ සඳහා අනුමැතිය ලබා දීමට නොහැකි වීමත් හේතුවෙන් වසර 04 ක පමණ කාලයක් තිස්සේ එම වාහනය යන්ත්‍රෝපකරණ අධිකාරියේ ගාල්කර ඇති බැව් විගණනයේදී අනාවරණය විය.

## 6.5 දෘෂ්‍ය අක්‍රමිකතා

------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මාර්ග අමාත්‍යාංශයට ලබාදී තිබූ අංක 65 - 2571 දරන ජීප් රථයට 2014 දෙසැම්බර් මාසයේදී වෙනත් ඇන්ජිමක් අනුමැතියකින් තොරව සවිකර තිබුණි. වාහනයේ ධාරිතාවයට සුදුසු නොවන එන්ජිමක් සවිකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 859,189 ක මුදලක් අලුත්වැඩියාව සඳහා දැරීමට සිදුවී තිබුණි.

## 6.6 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

6.6.1 පළාතේ රෝහල් 07 ක, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල 04 ක රෝහල් උපකරණ හා කාර්යාල උපකරණ ගණනාවක් වසර 01 සිට වසර 15 දක්වා වූ කාලයක් නිෂ්ක්‍රීයව පවතින බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

6.6.2 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු. ලක්ෂ 518 ක් වැය කර 2012 නොවැම්බර් 18 දින විවෘත කර තිබූ යාකරවත්ත ගුරු මධ්‍යස්ථානයේ අඩුපාඩු විශාල ප්‍රමාණයක් තිබූ බැවින්, ඉදිකර වසර 03 ක් ගතවී තිබුණද, එම ආයතනය නිශ්කාර්යව තබා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

6.6.3 මහකුඹුක්කඩවල රෝහලේ බාහිර රෝගී අංශය රු. 30,827,939 ක් වැයකර 2011-2015 වර්ෂවලදී අදියර 05 කින් නිමකර තිබුණ නමුත් 2016 මැයි 26 දින දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. රු.2,785,278 ක් වැය කර 2013 වර්ෂයේ ඉදිකරන ලද ආණමඩුව රෝහලේ මාතෘ සායනයද 2015 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

6.6.4 රු.2,293,358 වැය කර 2014 වර්ෂයේදී ඉදිකිරීම් නිමකර තිබූ ආනමඩුව රෝහලේ වැඩිහිටියන් රැක බලා ගැනීමේ ගොඩනැගිල්ල ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් භාර නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි.

6.6.5 කිරිමැටියාන මැටිකර්මාන්ත පුහුණු මධ්‍යස්ථානය වෙත 2014 දෙසැම්බර් මාසයේදී ලැබී තිබුණ යන්ත්‍ර 03 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

6.6.6 කුලියාපිටිය සහ මහව විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් ජීප් රථ දෙකක් ප්‍රයෝජනයට නොගෙන දීර්ඝ කාලයක සිට ගාල් කර තිබුණි.

6.6.7 2013 දෙසැම්බර් 31 දින රු.528,550 ක මුදලක් වැය කර අළුත්වැඩියා කර තිබුණු උදාරගම මැටි මධ්‍යස්ථානයේ විදුලි පෝරණුව 2015 දෙසැම්බර් 10 දින වන විටත් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි.

6.7 **හඳුනා ගන්නා ලද පාඩු**

**-----------------------**

පහත නිරීක්ෂණයන් කෙරේ.

6.7.1 පළාත් මාර්ග අමාත්‍යාංශය 2014 වර්ෂයේ උපමාන පාදක සංවර්ධන ව්‍යාපෘති සැලැස්ම යටතේ විදුලිබල සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී බෙදාහැරීම සඳහා රු.1,129,600 ක් වටිනා බල්බ 4000 ක් මිලදීගෙන එයින් බල්බ 2859 ක් බෙදා හැර තිබුණි. ඉතිරි තොගයෙන් රු. 181,018 ක් වූ බල්බ් 641 ක ඌනතාවයක් පැවති බැව් භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

6.7.2 පේෂකර්ම දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට අනුව රු.321,505 ක මුදල් ඌණතාවයක් හා රු.832,707 ක රෙදි ඌණතාවයක් නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳ නිසි පියවර ගෙන නොතිබුණි.

6.7.3 2015 මැයි මස සභාවෙන් ඉවත් වී තිබුණු එක් මන්ත්‍රීවරයෙකුගෙන් අය වීමට තිබූ රු.321,500 ක ණය අත්තිකාරම් මුදල විගණන දිනය වූ 2016 ජනවාරි 31 දින වන විටත් සභා ලේකම් කාර්යාලය විසින් අය කර ගෙන නොතිබුණි.

6.7.4 2014 වර්ෂයේ දී ජපානයේ පැවැත්වූන ශ්‍රී ලංකා උළෙලට සහභාගීවීමට විදේශ ගත වූ මන්ත්‍රීවරුන් 07 දෙනෙකු වෙනුවෙන් ගුවන් ටිකට්පත් මිළදී ගැනීම සඳහා මිළගණන් ඉදිරිපත් නොකල ආයතනයකින් ටිකට්පත් මිළදී ගැනීම නිසා පළාත් සභාවට රු.283,500 ක පාඩුවක් සිදු වී තිබුණි.

6.7.5 කිරිමැටියාන මැටි කර්මාන්ත පුහුණු පාසලෙහි ප්‍රාදේශීය අලෙවියෙන් එකතු වී තිබූ රු.11,446 ක මුදල 2015 දෙසැම්බර් 09 දින භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොකරන ලද අතර, රු.37,035 ක මුදලක් ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කල බව සනාථ වන ලිඛිත සාක්ෂි කිසිවක්ද විගණනයට ඉදිරිපත් නොවිණි.

6.7.6 කුරුණෑගල සමුපකාර උපකොමසාරිස් කාර්යාලයේ 2000 ජනවාරි 01 දින සිට 2005 ජනවාරි 31 දින දක්වා වූ කාල සීමාව තුල සිදුවී ඇති රු.380,854 ක මූල්‍ය වංචාවට සම්බන්ධ නිලධාරියා සේවයෙන් පහකර තිබුණද 2015 දෙසැම්බර් 31 දින වන විටත් අදාල මුදල ඔහුගෙන් අයකරගෙන නොතිබුණි.

6.7.7 පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් රෝහල් 06 ක සහ කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලීය ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ ඖෂධ වර්ග 413 ක වටිනාකම රු.16,945,704 ක් වූ ඒකක 10,162,768 ක්ද, වටිනාකම ගණනය කල නොහැකි වූ තවත් ඖෂධ වර්ග 53 ක්ද, කල් ඉකුත්වීම, නියැදි සාම්පල් අසමත්වීම, පැහැය හා සුවඳ වෙනස් වීම යන කරුණු නිසා භාවිතයෙන් ඉවත් කර තිබුණි

## 6.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

6.8.1 ගල්ගමුව රෝහල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කටයුතු අවසන් වෙමින් තිබුණද, රෝහලට ජලය සපයා ගැනීම ප්‍රධාන ගැටළුවක්ව පවතින බව නිරීක්ෂණය විය.

6.8.2 මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුරුණෑගල විධායක ඉංජිනේරු කාර්යාලය මගින් ප්‍රවර්තන වර්ෂය තුල වයඹ පළාත් සභාවට අයිති නොවන මාර්ග 05 ක් වැඩි දියුණු කිරීම වෙනුවෙන් රු.13,071,297 ක වියදමක් දරා තිබුණි. රු.4,631,844 ක වියදමින් වැඩි දියුණු කල දෙල්විට - බඹරකන්ද මාර්ගයේ පස් සම්බන්ධයෙන් කල Field Density පරීක්ෂාව අසමත් වී තිබුණද, එම මාර්ගය සඳහා ඉහත සඳහන් සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

6.8.3 විධායක ඉංජිනේරු කාර්යාල 04 විසින් 2015 වර්ෂයේ මාර්ග නඩත්තුව වෙනුවෙන් රු. 142,123,798 ක් වටිනා අමුද්‍රව්‍ය මිලදී ගෙන තිබුණ නමුත් තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

6.8.4 2015 නොවැම්බර් 30 දිනට පැවති ප්‍රගති වාර්තා පරීක්ෂාවේදී කර්මාන්ත 404 ක් ඉටුකිරීමට තිබූ නමුත් ඇස්තමේන්තු සකස්කර තිබුනේ කර්මාන්ත 395 කට පමණක් විය. එයින් කර්මාන්ත 369 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ නමුත් කර්මාන්ත 224 ක් පමණක් අවසන් කර තිබුණි.

6.8.5 කොන්ත්‍රාත්වලට එළඹ තිබූ රු. 3,967,355 ක් වටිනා කර්මාන්ත 07 ක කොන්ත්‍රාත් කාලය ඉක්මවා ඇතත් වැඩ ආරම්භ කර නොතිබුණ අතර, ඉදිකිරීම් කාලය අවසන් වී ඇති නමුත් සියයට 75 කටත් වඩා අඩුවෙන් වැඩ නිමකළ කර්මාන්ත 56 ක් විය.

6.8.6 මීගලෑව අම්ල සෙවන ළමා නිවාසය වැඩි දියුණු කිරීම සඳහා සකස් කළ ඇස්තමේන්තුව හා ගෙවීම් වාර්තාව අනුව රු.40,130 ක් වැඩියෙන් ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය.

6.8.7 වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ කර්මාන්ත 76 කට රු. 28,054,265 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. බිංගිරිය, ආරච්චිකට්ටුව හා ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රු.7,906,140 ක් වටිනා කර්මාන්ත 05 ක් පිළිබඳව සිදුකළ භෞතික පරීක්ෂාවේදී ඉටු නොකළ වැඩ කොටසෙහි වටිනාකම රු.992,293 ක් බව නිරීක්ෂණය විය.

## 6.9 ප්‍රමාද වූ ව්‍යාපෘති

6.9.1 මාදම්පේ ආයුර්වේද රෝහලට අයත් ඉඩම තුල රෝහල සඳහා නිල නිවසක් ඉදිකිරීම 2011 වර්ෂයේදී ආරම්භකර අතරමග නවතා දමා තිබුණි.

6.9.2 නාරම්මල දිසා රෝහලේ පල්දෝරු පද්ධතියේ ඉදිකිරීම් කටයුතු සඳහා 2012 වර්ෂයේදී රු. 2,604,337 ක් ගෙවා තිබුණ අතර, මෙයට අමතරව මෝටර් 02 ක් සහ අමතර කොටස් වෙනුවෙන් රු. 79,252 ක මුදලක්ද වැය කර තිබුණි. මෙම පද්ධතිය වසර 03 ක පමණ කාලයක සිට අක්‍රීය වී ඇති බැවින් ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුළු මුදලම නිෂ්ක්‍රීය වියදමක් බව නිරීක්ෂණය විය.

6.10 **විධිමත් පරිදි පවරා නොගත් දේපළ**

පහත නිරීක්ෂණයන් කෙරේ.

6.10.1 පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ආයුර්වේද රෝහල් 04 ක් හා ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා 21 ක් පිහිටි ඉඩම් 2015 වර්ෂය අවසන් වන විටද ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු අවසන් වී නොතිබූ හෙයින් රෝහල්වල පවතින අඩුපාඩු හා අළුත්වැඩියා කටයුතු නිසි අයුරින් ඉටුකිරීමට එය බාධාවක් වී ඇති බව නිරීක්ෂණය විය.

6.10.2 දඹදෙණිය මූලික රෝහල පිහිටි ඉඩම 2015 වර්ෂය අවසාන වන විටද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණු අතර එම කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ඉන් කොටසක් අනවසර පදිංචිකරුවන් අත්පත් කරගෙන තිබුණි.

6.10.3 පොල්ගහවෙල රෝහල පිහිටි ඉඩම 2015 වර්ෂය වන විටද වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණු අතර, ඉඩමේ කොටසක් අනවසරයෙන් පෞද්ගලික පරිහරණයට යොදාගෙන තිබුණි.

6.10.4 පොල්ගහවෙල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා වාරියපොල ප්‍රාදේශීය රෝහල පිහිටි ඉඩම් 2015 වර්ෂය වන විටත් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

**6.11** **කාර්ය මණ්ඩල පරිපාලනය**

2015 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කලාප කාර්යාල කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1559 | 1432 | 127 | - |
| තෘතියික මට්ටම | 551 | 380 | 171 | - |
| ද්විතියික මට්ටම | 9488 | 7801 | 1687 | - |
| ප්‍රාථමික මට්ටම | 4525 | 4069 | 456 | - |
| වෙනත් | - | 14 | - | 14 |
| එකතුව | 16123 | 13696 | 2441 | 14 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය (කලාප කාර්යාල හැර)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විදුහල්පති | 1915 | 1062 | 853 |

| | | | |
|---|---|---|---|
| ගුරුභවතුන් | 26380 | 22840 | 3540 |
| සුළු සේවක | 2563 | 2441 | 122 |
| වෙනත් | 638 | 391 | 247 |
| | -------- | ------- | ------- |
| එකතුව | 31496 | 26734 | 4762 |
| | ===== | ===== | ==== |

(ඇ) රෝහල් කාර්ය මණ්ඩලය
-----------------------------

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | -------- | ------- | ---------- | ---------- |
| කාර්යාලීය කාර්යය මණ්ඩලය | 777 | 620 | 157 | - |
| රෝහල් කාර්යය මණ්ඩලය | 7981 | 6783 | 1478 | 280 |
| | ------- | ------- | ------- | ------- |
| එකතුව | 8758 | 7403 | 1635 | 280 |
| | ===== | ==== | ==== | ==== |

(ඇ) අමාත්‍ය මණ්ඩල කාර්ය මණ්ඩලය
-----------------------------------

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|
| | -------- | -------- | ---------- |
| පෞද්ගලික ලේකම් | 06 | 06 | - |
| සම්බන්ධීකරණ ලේකම් | 08 | 08 | - |
| මාධ්‍ය ලේකම් | 02 | 02 | - |
| මහජන සම්බන්ධතා නිලධාරි | 06 | 06 | - |
| පෞද්ගලික සහකාර | 06 | 06 | - |
| කළමනාකරණ සහකාර | 18 | 18 | - |
| කාර්යාල කාර්ය සහයක | 12 | 13 | 01 |
| වෙනත් (රියදුරු) | 12 | 12 | - |
| | -------- | ------- | -------- |
| එකතුව | 70 | 71 | 01 |
| | ===== | ==== | ===== |

* මීට අමතරව පළාත් සභා මන්ත්‍රීවරුන්ට සහ පරිපාලනයට අදාලව 183 දෙනෙකුගෙන් යුත් ආදේශක කාර්ය මණ්ඩලයක්ද විය.

(ඇ) පළාත් පාලන කාර්ය මණ්ඩලය (පළාත් සභා)
-----------------------------------------------

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | --------- | -------- | ---------- | ------------ |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 19 | 10 | - |
| තෘතියික මට්ටම | 46 | 21 | 25 | - |
| ද්විතියික මට්ටම | 1229 | 949 | 280 | - |
| ප්‍රාථමික මට්ටම | 2563 | 3229 | - | 666 |
| වෙනත් | - | 219 | - | 219 |

| | | | | |
|---|---|---|---|---|
| එකතුව | 3867 | 4437 | 315 | 885 |

(ඉ) ව්‍යවස්ථාපිත ආයතන කාර්ය මණ්ඩලය(පළාත් සභා)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 21 | 14 | - |
| තෘතියික මට්ටම | 83 | 20 | 63 | - |
| ද්වීතියික මට්ටම | 194 | 195 | - | 01 |
| ප්‍රාථමික මට්ටම | 267 | 243 | 24 | - |
| වෙනත් | - | 39 | - | 39 |
| එකතුව | 579 | 518 | 101 | 40 |

## 6.11.1 පළාත් සභා අධ්‍යාපන හා සෞඛ්‍ය හැර අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩලය පිළිබඳ නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපකොමසාරිස් කාර්යාල සඳහා නිශ්චිත කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණි.

(ආ) පළාත් මාර්ග අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ අනුමත කාර්ය මණ්ඩලයට වඩා කාර්යාල කාර්ය සහායකයකු බඳවා ගැනීම නිසා 2015 ජනවාරි සිට අගෝස්තු දක්වා රු. 313,191 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට එක් තාක්ෂණ නිලධාරියෙකුගේ අතිරික්තයක් වූ අතර, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 04 ක්ද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 01 ක්ද, අනෙකුත් තනතුරු 48 ක්ද පුරප්පාඩු වී තිබීම නිසා අදාල රාජකාරි නිසි පරිදි ඉටුකිරීමට හැකි වී නොතිබුණි.

## 6.11.2 පාසල් කාර්ය මණ්ඩලය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පුත්තලම කලාපයේ පාසල් 200 ක අනිකුත් තනතුරු පුරප්පාඩු 1663 ක් විය.

(ආ) පුත්තලම කලාප කාර්යාලයේ සිංහල මාධ්‍ය ගුරුවරු 1066 ක්ද, දෙමළ මාධ්‍ය ගුරුවරු 774 ක්ද වශයෙන් මුළු ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 1840 ක් විය.

(ඇ) ඉබ්බාගමුව කලාප කාර්යාලයේ හා පාසල්වල තනතුරු වර්ග 25 ක අනුමත සේවක සංඛ්‍යාව 3198 ක් වූ අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 2679 ක් විය. ඒ අනුව තනතුරු වර්ග 15 ක සේවක ඌණතාවය 518 ක් වූ අතර, එක් තනතුරක අතිරික්තයක් නිරීක්ෂණය විය.

**6.11.3 සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ජොෂ්ඨ මට්ටම, තෘතික මට්ටම, ද්විතියික මට්ටම හා ප්‍රාථමික මට්ටමට අදාලව පිළිවෙලින් 46, 53, 828 හා 708 ක් වශයෙන් පුරප්පාඩු 1,635 ක් විය.

(ආ) පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා 05 ක ඖෂධ සංයෝජක තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබූ අතර, මාදම්පේ ආයුර්වේද රෝහලේ හෙද නිලධාරී, ආයුර්වේද නිලධාරී (විශේෂඥ) භෛසජ්ජක, කළමනාකරණ සහකාර, සම්භාහනකරු, උපස්ථායක හා මුරකරු යන තනතුරුවල පුරප්පාඩු 19 ක් විය.

(ඇ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හැට දෙදෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

**6.12 බැංකු සැසඳුම්**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වයඹ පළාත් දෙපාර්තමේන්තු 04 ක බැංකු ගිණුම් 05 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට නිකුත් කර මාස 06 ඉක්මවූ චෙක්පත් වල වටිනාකම රු.972,841 ක් වූ අතර, ඒවා සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 283.4 පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් 02 කට අදාලව රු.39,427 ක හඳුනා නොගත් හර හා දෙපාර්තමේන්තු 03 ක ගිණුම් 03 කට අදාලව රු.169,936 ක හඳුනා නොගත් බැර පැවති අතර, ඒවා නිරවුල් කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ එක් බැංකු ගිණුමක 2015 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ සටහන් නොවූ තැන්පතු වටිනාකම රු.11,425 ක් වූ අතර, තවත් එක් බැංකු ගිණුමක 2015 ඔක්තෝබර් 31 දිනට මුදල් පොතේ සටහන් නොවූ තැන්පතු වටිනාකම රු.2,154,008 ක්ද පැවතුණි. එම ශේෂයන් නිරවුල් කර ගැනීමට 2016 මැයි මාසය දක්වාත් කටයුතු කර නොතිබුණි.

(ඇ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුම් දෙකකට අදාලව 2015 දෙසැම්බර් මස බැංකු සැසඳුම් අනුව එකතුව රු. 155,196 ක් වූ උපලබ්ධි නොවූ තැන්පතු 21 ක් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 270 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**7. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**7.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් 2015 වර්ෂයේ ආයතන 267 ක් විගණනය කර වාර්තා නිකුත් කර තිබුණද, ඉන් ආයතන 121 ක පිළිතුරු ලබාදීම දින 37 සිට දින 260 දක්වා කාල පරාසයකින් ප්‍රමාද වී තිබූ අතර, ආයතන 105 කට යවන ලද විගණන විමසුම් සඳහා 2016 අප්‍රේල් 10 දින වන විටත් පිළිතුරු ලැබී නොතිබුණි.

## 7.2 විගණන හා කළමනාකරණ කමිටු

(අ) සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය සේවා, පළාත් ආයුර්වේද, පළාත් සමූපකාර සංවර්ධන යන දෙපාර්තමේන්තු විසින් 2015 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ඉඩම් කොමසාරිස් යන දෙපාර්තමේන්තු විසින් විගණන කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

## 7.3 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් ආයතන විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි.

- සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.
- පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
- පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

## 7.4 අයවැය ලේඛනමය පාලනය --

2015 අයවැය ලේඛනය පිළිබඳ සමස්ථ තත්ත්වය පහත දැක්වේ.

(i). 2015 වර්ෂයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වූ රු.31,102,338,585 ක ප්‍රතිපාදන වලින් රු.1,703,045,867 ක් 2015 දෙසැම්බර් 31 දින ආපසු පළාත් භාණ්ඩාගාරයට බැර කර තිබුණි.

(ii). අමාත්‍යාංශ 5 ක හා දෙපාර්තමේන්තු 22 ක් විසින් පරිපූරක ඇස්තමේන්තු 02 ක් මඟින් රු.4,806,973,585 ක මුදලක් ලබා ගෙන තිබුණි.

(iii). අත්තිකාරම් ගිණුම් සීමා

| | වියදමෙහි උපරිම සීමාව<br>රු. | සත්‍ය සීමාව<br>රු. | පරතරය<br>රු. | ලැබීම් වල අවම සීමාව<br>රු. | සත්‍ය සීමාව<br>රු. | පරතරය<br>රු. | හර ශේෂයේ උපරිම සීමාව<br>රු | සත්‍ය සීමාව<br>රු. | පරතරය<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආණ්ඩුකාරවර කාර්යාලය | - | - | - | 800,000 | 2,068,203 | 1,268,203 | 6,500,000 | 2,872,942 | 3,627,058 |
| පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 5,000,000 | 3,766,485 | 1,233,515 | 1,600,000 | 3,950,884 | 2,350,884 | 20,000,000 | 10,003,745 | 9,996,255 |
| කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | 9,000,000 | 4,452,595 | 4,547,405 | - | - | - | 20,000,000 | 10,253,034 | 9,746,966 |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 2,500,000 | 1,784,081 | 715,919 | 600,000 | 1,625,686 | 1,025,686 | 9,000,000 | 5,302,634 | 3,697,366 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | - | - | - | 4,500,000 | 17,033,738 | 12,533,738 | 26,000,000 | 19,552,323 | 6,447,677 |
| වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | - | - | - | 2,000,000 | 7,465,102 | 5,465,102 | 2,500,000 | 15,252,706 | 12,752,706 |

## 7.5 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව, ආයුර්වේද රෝහල හා නිල නිවාසවල පිහිටි වැසිකිලි පද්ධති මගින් බැහැර කරනු ලබන අපවිත්‍ර ජලය පරිසරයට මුදා හරිනු ලැබීම හේතුවෙන් එම ප්‍රදේශයේ දුර්ගන්ධයක් පැතිර ඇති බවත්, එමගින් රෝහලේ වාට්ටුවල සිටින හා ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන රෝගීන් මහත් අපහසුතාවයකට පත්වන බවත් නිරීක්ෂණය විය.

## 8. පද්ධති හා පාලනයන්

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පළාත් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුව තිබුණි.

| පද්ධතිය | පද්ධතියේ අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය හා ආදායම් රැස්කිරීම | (i). ආදායම් හා හිඟ ආදායම් ගිණුම්කරණය<br>(ii). හිඟ ආදායම් වාර්තා කිරීම<br>(iii). වැය ලෙජර පාලනය |
| (ආ) වත්කම් හා මානව සම්පත් කළමනාකරණය | (i). ජංගම නොවන වත්කම් ගිණුම් තැබීම<br>(ii). වාර්ෂිකව වත්කම් සමීක්ෂණය සිදු කිරීම<br>(iii). සේවක පරිපාලනය<br>(iv). කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීම |
| (ඇ) කොන්ත්‍රාත් ඉටුකිරීම් හා ගෙවීම් | (i). කොන්ත්‍රාත් පාලනය<br>(ii). සියලුම ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව ඉටු කිරීම<br>(iii). ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව සංශෝධිත කොන්ත්‍රාත් පිරිනැමීම<br>(iv). අදියර ක්‍රමයට කොන්ත්‍රාත් ඉටු කිරීම |
| (ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | (i). ව්‍යාපෘති කළමනාකරණය<br>(ii). ව්‍යාපෘතිය නිසි පරිදි සැලසුම්කරණය<br>(iii). නිම වූ වහාම ක්‍රියාකාරීත්වයට පත් කිරීම<br>(iv). අඛණ්ඩ පසු විපරම් කිරීම |
| (ඉ) ප්‍රඥප්ති මත පිහිට වූ ආයතනවල මූල්‍ය කටයුතු හා මෙහෙයුම් පාලනය | (i). සංයුක්ත සැලැසුම් ඇතුළුව ආයතන සැලසුම් සකස් කිරීම<br>(ii). පළාත් භාණ්ඩාගාරයේ පාලනය<br>(iii). ප්‍රාග්ධන කළමනාකරණය |

(ඊ) වාහන භාවිතය

(i). වාහන පාලනය
(ii). අලුත්වැඩියා හා නඩත්තු
(iii). හානි ලේඛණගත කිරීම හා හානි සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම
(iv). අලාභ නිශ්චය කිරීම හා අයකර ගැනීම